සුදු කොඩි නඩුවේ දේශපාලනය සහ නීතියට පටහැනි තීන්දුව - 1

ශ්‍රීලාල් සෙනෙවිරත්න

හිටපු හමුදාපති ජෙනරල් සරත් ෆොන්සේකාට එරෙහිව මොඩිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියේ විභාග කෙරුණු 'සුදු කොඩි' නඩුවේ දී බහුතර විනිසුරු දෙපොළ විසින් දුන් තීන්දුව අභියෝගයට ලක්කරමින් මේ වන විට විත්තිය ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් තිබේ. බහුතර විනිසුරු දෙපොළ සිය තීන්දුව ප්‍රකාශයට පත්කර ඇත්තේ අපරාධ නීතියේ මූලික සිද්ධාන්තයන් නොසලකා හරිමින් සහ අධිකරණය මනසින් විශ්ලේෂණය කළ යුතු කාරණා නොතකා හරිමින් බව විත්තිකරු කරුණු සහිතව සිය අභියාචනය මගින් කියා සිටියි. එබැවින් මොඩිකරණයේ තීන්දුව නිෂ්ප්‍රභා කර නඩු ගාස්තු සහ ශ්‍රේෂ්ඨාධිකරණයට මැතවැයි හැඟෙන වෙනත් සහන තමන්ට ලබාදෙන ලෙස විත්තිකරු ඉල්ලා තිබේ.

සුදු කොඩි නඩුව සෙසු බොහෝ අපරාධ නඩු වලට වඩා සුවිශේෂීය නඩුවකි. හදිසි නීතිය සහ දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ නීති උපදේශකයා වන නීතිපතිවරයා විසින් අනෙකුත් අපරාධ නඩුවක් හා සමානව මේ නඩුව පවරණු ලැබුවද එයට පසුබිම් වූයේ සුවිශේෂී දේශපාලන කරුණකි. එබැවින් සුදු කොඩි නඩුව ශ්‍රී ලංකාවේ නඩු තීන්දු විෂයයට පමණක් නොව දේශපාලන සහ ජනමාධ්‍ය විෂයයන්වද අදාළව සුවිශේෂී එකකි. ලෝකයේ කුමන රටක කුමන තරාතිරමක සිටියා වුවද සියලු ශ්‍රී ලාංකිකයන් විසින් මේ නඩුව, නඩු තීන්දු සහ එහි පසුබිම වෙසෙසින් විමසා බැලිම උචිතය.

දේශපාලන පසුබිම

තිස් වසරකට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලංකාව මුහුණ දී තිබූ බරපතලම අර්බුධය වූ එල්ටීටීඊ ත්‍රස්තවාදය හමුදා බලය යොදා පූර්ණ වශයෙන් පරාජය කරන අවස්ථාව වන විට රටේ විධායක ජනාධිපතිවරයා මහින්ද රාජපක්ෂය. ආරක්ෂක ලේකම්වරයා ජනාධිපති රාජපක්ෂගේ සොයුරු ගෝඨාභය රාජපක්ෂය. යුද හමුදාපති වූයේ සරත් ෆොන්සේකාය. එල්ටීටීඊ ප්‍රහාරක බලය සංවිධානය ලෙයින් සහ යකඩෙන් කුඩු පට්ටම් කළ සුපිරි හමුදා වීරයා ලෙස ජෙනරල් දෙස් විදෙස් වෙසෙස් අවධානයටද, ජනපති මහින්දට නො-දෙවෙනි ජනප්‍රසාදයකටද හිමිකම් කීවේය. යුද ජයෙන් පසු ජනාධිපතිවරයා සහ ජෙනරල් ෆොන්සේකා අතර ඇතිවූ මතභේදයක් නිසා ජෙනරල්වරයා ඒ වන විට දැරූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී තනතුරෙන් ඉවත්ව ජනාධිපතිවරණයට ඉදිරිපත්විය. අසරණව සිටි විරුද්ධ පක්ෂ ජනතාව ජෙනරාල්ගේ ආගමනයෙන් නව පමණක් ලැබුවේය. එතෙක් කිසිදු ලැබීය. දඬුවම් ලෙස ජෙනරල් ෆොන්සේකාගේ හමුදා නිලය අහෝසිකර ඔහුට වසර දෙකහමාරක සිර දඬුවක් නියම කළේය.

යුද අධිකරණය හමුවේ ජෙනරල් ෆොන්සේකාට එරෙහිව පැවැත්වෙන නඩු විභාග විවාදාත්මකව ඉදිරියට යමින් තිබියදී නීතිපතිවරයා විසින් ජෙනරල් ෆොන්සේකාට විරුද්ධව සිවිල් අධිකරණය හමුවේ නඩු පැවරීමට පටන්ගත්තේය. එලෙස අටවනු ලැබූ එක් නඩුවක් වූයේ සුදු කොඩි නඩුවය.

(3) පළමු චෝදනාවට අදාළ ක්‍රියාකලාපය මගින්ම ලංකාණ්ඩුවට විරුද්ධත්වයක් දැක්වීමේ හැඟීම ඇවිස්සීමේ හෝ ඇවිස්සීමට තැත්කිරීමෙන් හෝ ශ්‍රී ලංකා ජනරජයේ වැසියන් අතර අසන්තෝෂයක් හෝ විරුද්ධත්වය ඇති කරවීමට හෝ වැසියන් අතර සතුරු හැඟීම් වැඩි දියුණු කිරීමට තැත්කිරීම. එමගින් දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර තිබීම.

2010 ඔක්තෝබර් 04 දින බස්නාහිර පළාත්බද මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියේ මෙම නඩුව කැඳවා ජෙනරල් ෆොන්සේකාට මෙම අධි චෝදනා ඉදිරිපත් කළ අතර එම චෝදනාවන්ට තමන් නිවැරදිකරු බව ජෙනරල් ෆොන්සේකා ප්‍රකාශ කිරීමෙන් පසුව නඩුව විභාගයට ගැණුහි. නඩු විභාගයේදී පැමිණිල්ල ඉදිරිපත් කළ නීතිපතිවරයා විසින් සාක්ෂිකරුවන් 22 දෙනෙකුගේ සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කළේය. අනතුරුව විත්ති පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කිරීම ඇරඹුණු අතර එහිදී සාක්ෂිකරුවන් 08 දෙනෙකු අධිකරණය හමුවේ සාක්ෂි දුන්හ.

සාක්ෂි විභාගයෙන් අනතුරුව පැමිනිල්ලේ දේශණ සහ විත්තියේ දේශණ පැවැත්වුණු අතර නඩු විභාගය අවසන් කළ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල 2011 නොවැම්බර් 18 දින සිය තීන්දුව ප්‍රකාශයට පත්කරනු ලැබූහ. තීන්දුව බෙදුණු එකක් විය. ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලේ සාමාජික විනිසුරු ඩබ්.ටී.එම්.ජී.බී. වරාවැව විනිසුරුවරයා විසින් සියලු චෝදනාවලින් විත්තිකාර ජෙනරල් ෆොන්සේකා නිදොස් කොට නිදහස් කළේය. විනිසුරු මඩුල්ලේ සෙසු සාමාජිකයන් දෙදෙනා වූ දීපාලි විජේසුන්දර (සභාපති) සහ සුල්ෆිකාර් රශීන් විසින් 2 සහ 3 චෝදනාවලින් ජෙනරාල්වරයා නිදොස් කොට නිදහස් කළද 1 චෝදනාවට වැරදිකරු කර වසර තුනක සිර දඬුවමක් සහ රුපියල් පන්දහසක දඩයක් නියම කළහ.

ජෙනරල් ෆොන්සේකා වරදකරු කිරීමෙන් පසු දඬුවම් නියම කිරීමට පෙර දඬුවම් අඩුකර ගැනීම සඳහා යමක් කීමට ඇත්දැයි විනිසුරුවරුන් විමසා සිටි අවස්ථාවේදී විත්තිකූඩුවේ සිට අධිකරණය අමතමින් වුදිත ෆොන්සේකා මහතා කියා සිටියේ මෙය සාධාරණ නඩු තීන්දුවක් ලෙස තමන් පිළිනොගන්නා බවයි. නඩු තීන්දුව පිළිකුලෙන් ප්‍රතික්ෂේප කරන බවත් මේ වරද යම් දිනෙක නිවැරදි නොවුණහොත් එය අධිකරණ ඉතිහාසයේ කලු පැල්ලමක් වනු ඇති බවත් ප්‍රකාශ කළ ජෙනරල්වරයා ඔහු සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ විනිසුරුවරයාට හිසනමා ආච-ාරය පළකළේය.

නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත්කිරීමෙන් පසු අධිකරණය අවට රැස්ව සිටි දහස් ගණනක රාජපක්ෂ ජනාධිපතිවරයාටත්, ජෙනරල් වැරදිකරු කළ දඬුවම් නියම කළ විනිසුරු දෙපොළටත් ශාප කරමින් පොල් ගැසූහ. ජෙනරල් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ විනිසුරු වරාවැවගේ පරිඝණකයට කිසියම් පිරිසක් හානි පමුණුවා තිබුණු බව පසුව අනාවරණය විය. සුදු කොඩි නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත්කොට සති දෙකකින් ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් විනිසුරු මඩුල්ලේ සභාපති ලෙස කටයුතු කළ දීපාලි විජේසුන්දර විනිසුරුවරිය අභියාචනාධිකරණ විනිසුරු ධුරයට උසස් කරනු ලැබුවේය. මොඩිකරණය විසින් සිදුකරනු ලැබුවේයැයි තමන් සලකන වරද අධිකරණය විසින්ම නිවැරදිකරවා ගැනීම වස්, විශිෂ්ටය මණ්ඩලයේ බහුතරය විසින් 1 චෝදනාවට ජෙනරල්වරයා වැරදිකරු කරනු ලැබ ඇති ආකාරය මේ වන විට ජෙනරල් ෆොන්සේකා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක්කරනු ලැබ තිබේ.

බහුතර විනිසුරු තීන්දුවේ හැටි

මෙහිළා අභියාචක ජෙනරල් ෆොන්සේකා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානයට ලක්කරනු ලැබ ඇති කරුණු මෙසේය.

1. පැමිණිල්ල සිය චෝදනා සාධාරණ සැකයකින් ඔබ්බට ඔප්පු කර නොමැත. බහුතර විනිසුරු දෙපොළ විත්තියේ සාක්ෂි සහ ලේඛන හිසි

30 වන පිටට

සම්පූර්ණයෙන්ම විනාශ කර, ප්‍රභාකරන් ඇතුළු එම සංවිධානයේ ප්‍රමුඛ නායකයන් සියලුදෙනාම මරා දැමීමෙන් පසු එතෙක් ආණ්ඩුවට නොතිබූ ජනප්‍රසාදයක් හිමිවිය. ඒ වන විට ජනාධිපති මහින්ද රාජපක්ෂගේ උපාය මාර්ගික දේශපාලනය විසින් සියලු විරුද්ධ පක්ෂ ඡේද බින්න කර, එම පක්ෂවල ඉදිරිපෙළ නියෝජිතයන් ආණ්ඩුවට එක්කරගෙන තිබූ අතර එහි ප්‍රතිපලය ලෙස ආණ්ඩුවවේ කවර කටයුත්තකට එරෙහිව වුවද යමක් කිරීමට නොහැකි තරම් දුර්වල තත්ත්වයකට විපක්ෂ පත්කරනු ලැබ තිබිණ. මේ සුවිශේෂී තත්ත්ව යටතේ රටේ එකම සහ අසහාය නායකයා ලෙස මහින්ද රාජපක්ෂ ඉස්මතුව සිටියේය. යුද ජයග්‍රහණයත් සමග ජනාධිපති මහින්ද රාජපක්ෂ හිරුසේ නැගී එද්දී විරුද්ධ දේශපාලන පක්ෂ නායකයන් හිරු දුටු කඳෝපැණියන් බවට පත්විය. මේ අවස්ථාව සිය දේශපාලන බලය තහවුරු කරගැනීමට යළිත් කිසිදා නොලැබෙන අවස්ථාවක් බව දත් ජනාධිපති රාජපක්ෂ සිය ධූර කාලය අවසන්වීමට වසර දෙකක් ඉතිරිව තිබියදී ජනාධිපතිවරණයක් කැඳවීය.

ඒ වන විට ජනාධිපති රාජපක්ෂ සමග තරග කර ජයගැනීමට තබා, ඔහුට එරෙහිව ජනාධිපතිවරණයකට ඉදිරිපත් කරන්නට සුදුස-සකුවත් සොයා ගැනීමට විරුද්ධ දේශපාලන පක්ෂයන්ට නොහැකි විය. ජනාධිපතිවරණයක් කැඳවීමෙන් පසු ජනපති රාජපක්ෂ විවිධ අවස්ථාවලදී තමන් සමග තරග කරන්නට ඉදිරිපත් කරන අපේක්ෂකයා කවුරුන්දැයි විරුද්ධ දේශපාලන පක්ෂ වෙතින් ප්‍රසිද්ධියේ විමසා සිටියේ හාස්‍ය ජනක ලෙසිනි.

මේ තත්ත්වය කිසිවෙකුත් නොසිතූ ලෙස කණපිට පෙරළුණේ විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ජෙනරාල් සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමත් සමගිනි. යුද ජයග්‍රහණයේ දේශපාලන වීරයා ජනාධිපති රාජපක්ෂ වන විට එහි හමුදා වීරයා බවට පත්ව සිටියේ ජෙනරාල් ෆොන්සේකාය. ලෝකයේ දරුණුතම ත්‍රස්තවාදී අභියෝගයකින් තොරව ජනාධිපතිවරණය ජයගැනීමේ අවස්ථාව හිමිකරගෙන සිටි ජනාධිපති රාජපක්ෂට තම ජයග්‍රහණය ගැන දෙවරක් සිතා බලන්නට සිදුවන තත්ත්වයක් නිර්මාණය විය. එහි ප්‍රතිඵලය වූයේ සියලු රාජ්‍ය බලය අයථා ලෙස සිය මැතිවරණ ව්‍යාපාරය සඳහා යොදාගනිමින් සහ දැඩි ලෙස මැතිවරණ නීති උල්ලංඝණය කරමින් ජනපති රාජපක්ෂ සිය ජයග්‍රහණය තහවුරු කරගැනීමය. ජනාධිපතිවරණ නිරීක්ෂක වාර්තා විමසා බැලූ විට ජනාධිපතිවරයා සිය ජයග්‍රහණය සඳහා ගිය ගමන කෙසේවිද යන්න තක්සේරු කළ හැකිය.

විපක්ෂයේ පොදු අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා පරදවා ජනාධිපති මහින්ද රාජපක්ෂ දෙවන වරටත් ජනාධිපති ධූරයට පත්වූ වහාම කිසිදු චෝදනාවක් නොමැතිව පරාජිත අපේක්ෂක

<u>සුදු කොඩි නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත්කොට සති දෙකකින් ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් විනිසුරු මඩුල්ලේ සභාපති ලෙස කටයුතු කළ දීපාලි විජේසුන්දර විනිසුරුවරිය අභියාචනාධිකරණ විනිසුරු ධූරයට උසස් කරනු ලැබුවේය.</u>

ජෙනරාල් ෆොන්සේකා හමුදාව යොදවා අත්අඩංගුවට ගත්තේය. අනතුරුව

ජෙනරාල්වරයාට එරෙහිව චෝදනා කීපයක් ගොණුකර හමුදා අධිකරණයක් හමුවට පමුණුවන ලදි. නඩු ඇසීමට පත්කළේ ජෙනරාල් ෆොන්සේකා හමුදාපති ධූරය දැරූ අවධියේ ඔහු විසින් විවිධ වැරදි සම්බන්ධයෙන් දඬුවමට ලක්කරනු ලැබූ හමුදා නිලධාරීන් ද ඇතුළත් විනිසුරු මඩුල්ලකි. විත්තිය විසින් මතුකළ සියලු විරෝධතා නොතකා නඩු කටයුතු ඉදිරියට පවත්වාගෙන ගිය හමුදා අධිකරණය මගින් ජෙනරාල්වරයාට එරෙහිව නගා තිබූ සියලු චෝදනාවලට ඔහු වැරදිකරු කරනු ලිපිය දීර්ඝ වන බැවින් 'සුදු කොඩි නඩුව' හා අදාළ වන අධිකරණමය සහ ජනමාධ්‍ය පසුබිම හා විශේෂතා මෙහිළා සාකච්ඡාවට බඳුන් නොවේ.

ජෙනරල්ට එරෙහි චෝදනා

නීතිපතිවරයාගේ ඉල්ලීමක් අනුව අගවිනිසුරු-වරයාගේ නියෝගයකින් ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් හමුවේ විභාගයට ගැණුනු මෙම නඩුව විභාග කළ විනිසුරු මඩුල්ල වූයේ දීපාලි විජේසුන්දර (සභාපති), එම්. ශුල්ෆිකාර් රශීන් (සාමාජික), ඩබ්.එම්.ටී.බී. වරාවැව (සාමාජික) ය. රජය වෙනුවෙන් නීතිපතිවරයා විසින් ගිටපු යුද හමුදාපති,ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට එරෙහිව නගා තිබූ චෝදනා තුන සැකෙවින් මෙසේය.

(1) වර්ෂ 2009 දෙසැම්බර් 08 හෝ ආසන්න දිනයකදී මහජනයා බිය වැද්දිය හැකි හෝ මහජනයා කැළඹිය හැකි ව්‍යාප්ත ප්‍රකාශයක් කට වචනයෙන් හෝ වෙන කවර ක්‍රමයකින් හෝ පැතිරවීම හෝ විසුරුවාහැරීම. (එනම් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යුද හමුදාවේ 58 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වාට දුරකථනයෙන් කතාකොට, යටත්වීමට උත්සාහ දරන කිසිම එල්ටීටීඊ නායකයකුට යටත්වීමට ඉඩ නොතබා ඔවුන් සියලු දෙනාම මරා දැමිය යුතු බව කියා සිටියේයැයි සන්ඩේ ලීඩර් කතුවරිය වන ෆෙඩිරිකා ජෑන්ස්ට් පැවසීම).
එමගින් හදිසි නීතිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර තිබීම.

(2) පළමු චෝදනාවට අදාළ ක්‍රියාකලාපය මගින් කෙලින්ම හෝ අන් ආකාරයකින් ජාතිවාදී හැඟීම් ඇවිස්සෙන සුළු යම් කරුණක් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම.
එමගින් හදිසි නීතිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර තිබීම.